(9)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 04/2012

මගේ අංකය:DAPH/AD/5/2
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2012.09. 21

සියළුම පළාත් අධ්‍යක්ෂ වරුන්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**<u>පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සතුන් බෙදාදීම</u>**

විවිධ ආයතන හා සංවිධාන මඟින් පශු සම්පත් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මත කිරීමේදී එම ව්‍යාපෘති වලින් බලාපොරොත්තු වන අරමුණුකරා ලඟාවීම සිදු නොවන බවත්, විවිධ අක්‍රමිකතා සිදුවන බවත්, විටින් විට මා වෙත වාර්තා වී ඇති අතර, එය පොදුවේ රාජ්‍ය සේවයට මෙන්ම සත්ත්ව නිෂ්පදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවටද අපකීර්තියක් ගෙන දෙන කරුණකි.

02. එබැවින් පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (පළාත් හා මධ්‍යම රජයේ) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වන්නේ නම් හා සහයෝගය දක්වන්නේ නම් පහත සඳහන් උපදෙස් සහ මඟ පෙන්වීම අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. මෙය හුදෙක් මාර්ගෝපදේශයක් වන බැවින්, ඔබ පළාතට ගැලපෙන අයුරින් අනුගත කරගන්නා මෙන්ද කාරුණිකව දන්වමි.

i. සංවර්ධන වැඩ සටහන් යටතේ සතුන් ලබාදීමේදී අභිජනනයට සුදුසු සතුන් සහ වටිනාකමට සරිලන ආකාරයේ සතුන් ප්‍රතිලාභීන්ට නොලැබෙන බවට චෝදනා ලැබී ඇති බැවින්, ව්‍යාපෘතීන් සඳහා සතුන් තේරීමේදී අදාල ගොවි මහතුන්ද සමඟ සතුන් තේරීමට කටයුතු කරන මෙන්ද, එම සතුන් ලබාදෙන ප්‍රතිලාභීන් අයත් වසමේ පශු වෛද්‍ය නිලධාරි වරයාද, එම සතුන් මිලදී ගන්නා වසමේ පශු වෛද්‍ය නිලධාරි වරයාද, සතුන් තේරීමේ ක්‍රියාවලියට යොදවා ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ii. සතුන්ගේ වටිනාකම තීරණය කිරීමේදී සතුන් මිලදී ගන්නා ප්‍රදේශයේ සහ සතුන් ලබාදෙන ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරි වරයාද, ඇතුලත්වන අයුරින් කමිටුවක් සකස්කර එමඟින් වටිනාකම තීරණය කර ගැනීමට කටයුතු යොදන්න.

iii. සතුන් ප්‍රවාහනය කිරීමේදී විවිධ ආකාරයේ චෝදනා සහ අකටයුතුකම් සිදුවන බව වාර්තාවන බැවින්, ඒ සම්බන්ධව පහත සඳහන් ක්‍රියාමාර්ග ගතයුතු බව දන්වමි.

a. සතුන් ලබාදීම සඳහා මැදිහත්වන ව්‍යාපෘතීන් කුමන පදනමකින් ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව සතුන් තේරීමේ සහ මිලදී ගැනීමේ කටයුතුවල යෙදෙන පශු වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

b. අදාල ව්‍යාපෘතිය යටතේ සතුන් ලබාදීමට නියමිත ප්‍රතිලාභීන්ගේ නාම් ලැයිස්තුවක් සෞඛ්‍ය සහතිකය ලබාදෙන පශු වෛද්‍ය නිලධාරී වරයාට සහ මෙම කටයුත්තට සහභාගීවන අනෙකුත් පශු වෛද්‍ය නිලධාරීන් වෙත ලබාදීම.

c. සතුන්ගේ හඳුනා ගැනීමේ කටයුතු නිසිපරිදි සිදු කිරීම. ( Ear tags, කණ් තෝඩු සවි කිරීම)

iv.සත්ත්ව පනත සහ සත්ත්ව රෝග පනතට අනුකූලව

- සතුන් ප්‍රවාහනය කරන රථය ඒ සඳහා සුදුසු බවට අදාල පශු වෛද්‍ය නිලධාරී වරයාගේ නිර්දේශය.
- අදාල සතුන් සඳහා වන සත්ත්ව සෞඛ්‍ය සහතිකය
- සතුන් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් සහතිකය.

යන සහතික ලබාගන්නා ලෙසට අදාල ආයතනයට,සංවිධානයට, පුද්ගලයාට උපදෙස් ලබාදීම.

වෛද්‍ය ඩබ්ලිව් කේ.ද සිල්වා
සතත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-1. ලේකම්,පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සියළුම අධ්‍යක්ෂ වරුන්.
3. සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන්
4. පොලිස්පති ,පොලිස් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති
6. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන අංශය)